සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසාන වාර පරීක්ෂණය 2016
## 10 ශ්‍රේණිය සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I කාලය පැය 01 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

උපදෙස් :
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- 01 සිට 40 තෙක් ප්‍රශ්න වලදී වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ කතිර (×) ලකුණක් යොදන්න.

01. කඩදාසිය සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) කඩදාසිය මුලින්ම සොයා ගනු ලැබුවේ ඇමරිකානු ජාතිකයෙකි.
(2) කඩදාසිය මුලින්ම සකස් කරනු ලැබුවේ ක්‍රි.ව. 105 දී ය.
(3) ට්සායිලුං කඩදාසියේ නිර්මාතෘ විය.
(4) මුද්‍රණය ආරම්භ වීමට පෙර ලිවීමට මෙන්ම බිත්ති සැරසිලි සඳහාත්, පාර්සල් එතීම සඳහාත් කඩදාසිය භාවිතා කර තිබේ.

02. සන්නිවේදන ක්‍රියාවලියේදී සන්නිවේදකයාගේ කාර්යයක් නොවන්නේ,
(1) සන්දේශය සැලසුම් කිරීම. (2) සන්දේශය ප්‍රතිග්‍රහණය කිරීම.
(3) යෝග්‍ය මාධ්‍යයක් තෝරා ගැනීම. (4) ග්‍රාහකයා හඳුනා ගැනීම.

03. මහාචාර්ය හැරල්ඩ් ඩී. ලැස්වෙල් විසින් ඉදිරිපත් කළ සන්නිවේදනය පිළිබඳ අර්ථකථනයේ සුවිශේෂීත්වය වන්නේ,
(1) සන්නිවේදනයේ ද්වීමාර්ගික බව හඳුන්වා දීමයි.
(2) සන්නිවේදනයේ දී බාධා ඇතිවිය හැකි බව පෙන්වීමයි.
(3) ප්‍රතිපෝෂණ ක්‍රියාවලිය සන්නිවේදනය සක්‍රීය කරන ආකාරය ඉදිරිපත් කිරීමයි.
(4) සන්දේශය හේතුවෙන් ග්‍රාහකයා තුළ බලපෑමක් සිදුවන බව පැහැදිලි කිරීමයි.

04. අවාචික සන්නිවේදනයේ සමාජීය සාධකයන්ට අනුව යහළුවන් අයත්වන්නේ,
(1) සහෘද අවකාශයටය. (2) සමාජීය අවකාශයටය.
(3) පෞද්ගලික අවකාශයටය. (4) පොදු අවකාශයටය.

05. ඡායාරූපයක් ගැනීමේ ''රූප සංරචනය'' (Composition) ලෙස දක්වන්නේ,
(1) වැඩි අවධානයට ලක් නොවිය යුතු වස්තූන් ඡායාරූපය ගැනීමට පෙරම ඉවත් කිරීමයි.
(2) ප්‍රිය මනාප ඡායාරූපයක් සඳහා පරිසරය සකස් කිරීමයි.
(3) රූප රාමුවට ඇතුළත් කළ යුතු වස්තූන් නිසි පරිදි සංවිධානය කිරීමයි.
(4) ගන්නා ලද ඡායාරූපයක් සංස්කරණය කිරීමයි.

06. රැකියා වෙළඳ පළෙහි ජනප්‍රිය රැකියාවන් කෙරෙහිම ඉල්ලුමක් ඇතිවීම වළක්වා නව රැකියා අවස්ථා කෙරෙහි නැඹුරුවක් ඇති කිරීමට මූලික වශයෙන් ජනමාධ්‍ය කළ යුත්තේ,
(1) සමාජය තුළ රැකියා සම්බන්ධයෙන් ඇති ආකල්ප වෙනස් කිරීමයි.
(2) පෞද්ගලික විද්‍යා පීඨයකින් හෝ ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරිය යුතු බවට දැනුවත් කිරීමයි.
(3) රැකියාවන්ගේ ස්වභාවය අනුව සමාජ පන්ති නිර්මාණය වන ආකාරය දැනුවත් කිරීමයි.
(4) පහසුවෙන් මුදල් ඉපයිය හැකි දූෂිත ක්‍රම පිළිබඳව ටෙලි නාට්‍ය යනාදියෙන් ඉඟි කිරීමයි.

07. අන්තර් ක්‍රියාකාරී පුවරුවෙහි විශේෂත්වය වන්නේ,
(1) පරිගණකය හා සම්බන්ධ වීමයි.
(2) මවුසයක් මගින් පරිගණකය ක්‍රියාත්මක වීමයි.
(3) පුවරුව ඇඟිල්ලෙන් ස්පර්ශ කරමින් පරිගණකය ක්‍රියාත්මක කළ හැකි වීමයි.
(4) පරිගණකය යතුරු පුවරුව යොදා ගනිමින් පුවරුව මත අකුරු යෝජනය කළ හැකි වීමයි.

08. ආගමික සහජීවනය පවත්වාගෙන යාමට ජනමාධ්‍යයට මැදිහත්විය හැකි අවස්ථා වන්නේ,
(1) මාධ්‍ය හිමිකාරීත්වය නියෝජනය කරන ආගමානුකූල කටයුතු සම්බන්ධයෙන් වැඩි නැඹුරුවක් දැක්වීම.
(2) ජනගහනයෙන් සුළුතරයක් අදහන ආගම් සම්බන්ධයෙන් වැඩි අවකාශයක් ලබා දීම.
(3) බහු ආගමික ප්‍රදේශයක ගැටුමක් ඇති වූ විට ආගම් වල නාමය සම්බන්ධ කරමින් වැරදි කරුවන් ඉදිරිපත් කිරීම.
(4) සියළු ආගම්වල ආගමික උත්සව සඳහා ප්‍රමාණවත් සෘජු නියෝජනයක් සිදු කිරීම.

09. කිසියම් දුරක පුළුල්ව පැතිරී සිටින පිරිසකගේ සමීප රූපයක් ගැනීමට භාවිතා කළ යුතු කාච වර්ගය වන්නේ,
(1) සාමාන්‍ය කාච (2) යුහුඹු කාච (3) පුළුල් කෝණ කාච (4) දුර රූප කාච

10. මාර්ග සංඥා, ධාරා සටහන්, පොත් පිංච හා අත්පත්‍රිකා අයත් වන්නේ,
(1) නූතන දෘශ්‍ය මාධ්‍යයන්ටය. (2) ජනමාධ්‍යයන්ටය.
(3) සාම්ප්‍රදායික දෘශ්‍ය මාධ්‍යයන්ටය. (4) මුද්‍රිත මාධ්‍යයන්ටය.

11. සිංහල මහ සභාව විසින් ප්‍රකාශයට පත් කළ පුවත්පතකි,
(1) සිංහල බෞද්ධයා (2) සිංහල බලය (3) ලංකා ලෝකය (4) ලක්මිණි පහන

12. එක් එක් ජන කණ්ඩායමට සුවිශේෂ වූ සන්නිවේදන රටා හඳුන්වන්නේ,
(1) ප්‍රාථමික සන්නිවේදන ක්‍රම ලෙසය. (2) සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම ලෙසය.
(3) මානව සන්නිවේදන ක්‍රම ලෙසය. (4) උප සංස්කෘතික සන්නිවේදන ක්‍රම ලෙසය.

13. පාසලේ නියෝජ්‍ය විදුහල්පතිවරුන් එක්වී කිසියම් වැදගත් කරුණක් පිළිබඳ සාකච්ඡා කරමින් සිටී. මෙම අවස්ථාව,
(1) විධිමත් ඉහළ සිට පහළට සිදුවන සන්නිවේදන අවස්ථාවකි.
(2) විධිමත් හරස් සන්නිවේදන අවස්ථාවකි.
(3) විධිමත් පහළ සිට ඉහළට සිදුවන සන්නිවේදන අවස්ථාවකි.
(4) අවිධිමත් පර්ෂද දාමයක් ආකාරයෙන් සිදුවන සන්නිවේදන අවස්ථාවකි.

14. ජන මාධ්‍යයේ ක්‍රියාකාරීත්වයට රජය වක්‍රව මැදිහත් වූ අවස්ථාවක් වන්නේ,
A - මාධ්‍යවේදීන් සඳහා අඩු පොලියකට නිවාස ණයක් ලබාදීම.
B - සියළු මාධ්‍යයන්ට පෞද්ගලික වෛද්‍ය විශ්ව විද්‍යාල සම්බන්ධ මාධ්‍ය සාකච්ඡා තාවකාලිකව නවතා දැමීමට දැනුම් දීම.
C - මාධ්‍යවේදීන් සඳහා ආචාර ධර්ම පද්ධතියක් ප්‍රකාශයට පත් කිරීම.
D - සියළු ජනමාධ්‍යවල ප්‍රවෘත්ති පාලනය කිරීමට බලධරයෙකු පත් කිරීම.
(1) D පමණි. (2) A, D පමණි. (3) A, B, D පමණි. (4) A, B, C පමණි.

15. ළමා අයිතිවාසිකමක් උල්ලංඝනය නොවන අවස්ථාවකි,
(1) අවුරුදු දාහතරකට අඩු දරුවෙකු මෙහෙකාර වෘත්තියේ යෙදවීම.
(2) මව විදේශ ගත වූ නිසා බාල සොයුරු සොයුරියන්ගේ රැකවරණයට සොළොස් වියැති දූරිය පාසල් නොයවා ගෙදර රඳවා ගැනීම.
(3) පහේ ශිෂ්‍යත්ව විභාගය සමත්වූ 12 වියැති දූරියක ප්‍රධාන නගරයක පාසල් නේවාසිකාගාරයේ නැවැත්වීම.
(4) බාල වයස්කාර දරුවෙකු දේශපාලන සටන් පාඨ වෙනුවෙන් භාවිතා කිරීම.

16. සාහිත්‍ය සමිතියේ දී ඉදිරිපත් කළ යුතු කථාවෙහි අඩංගු විය යුතු කරුණු පිළිබඳව සිතමින් සිටි නිමල් වැදගත් කරුණු කඩදාසියක සටහන් කරන්නට විය. මෙහිදී ඔහු යෙදී සිටින්නේ,
(1) අන්තර්පුද්ගල හා වාචිත සන්නිවේදනයේ ය.
(2) අන්තර්වර්තී පුද්ගල හා ලිඛිත සන්නිවේදනයේ ය.
(3) සමූහ හා ලිඛිත සන්නිවේදනයේ ය.
(4) නිර්වාචික හා ලිඛිත සන්නිවේදනයේ ය.

17. ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ආරම්භය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) 1832 දී, ඉංග්‍රීසියෙන් පළකල කොමර්ෂල් ඇඩ්වටයිසර් පුවත් පතත් 1979 දී ජාතික රූපවාහිනියත් 1924 දී ගුවන් විදුලියත් ජනමාධ්‍යයේ ආරම්භක මාධ්‍ය විය.
(2) 1874 දී 'ඔබ්සවර්' ඉංග්‍රීසි පුවත්පතත්, 1930 දී ගුවන් විදුලියත්, 1979 දී TNL රූපවාහිනියත් ප්‍රථම මාධ්‍ය ආරම්භය විය.
(3) 1832 දී කලම්බු ජර්නල් ඉංග්‍රීසි පුවත්පතත්, 1924 දී ගුවන් විදුලියත්, 1979 දී ස්වාධීන රූපවාහිනී සේවාවත් ආරම්භක මාධ්‍ය විය.
(4) 1947 දී ඩේලිනිව්ස් ඉංග්‍රීසි පුවත්පතත්, 1924 දී ගුවන් විදුලියත්, 1982 දී ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවත් ආරම්භ විය.

18. ජන වර්ගයක් යන්නට අදාල නොවන්නේ,
(1) එකම භාෂාවක් මවු භාෂාව ලෙස කථා කරන පිරිසක් වීම.
(2) එකම ආගමක් අදහන ජන කොටසක් වීම.
(3) පොදුවේ පිළිගත් සංස්කෘතියක් තුළ ජීවත් වීම.
(4) විවිධ සංස්කෘතික ජනකොටස් එකට ජීවත් වීම.

19. සංඛ්‍යාංක (DIGITAL) තාක්ෂණය සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
   (1) සංඛ්‍යාංක තාක්ෂණයේ දී විද්‍යුත් සංඥාවක් ගමන් කරන්නේ ස්පන්ද ආකාරයටය.
   (2) විද්‍යුත් ධාරාවක් පැවතීම 0 (බිංදුව) ලෙසත් විද්‍යුත් ධාරාවක් නොපැවතීම 1 (එක) ලෙසත් සංඛ්‍යාංක තාක්ෂණයේදී ගැනෙයි.
   (3) සංඛ්‍යාංක තාක්ෂණය සහිත උපාංග තොරතුරු හඳුනා ගන්නේ 1 (එක) සහ 0 (බිංදුව) යන සංකේතවලට තොරතුරු පරිවර්තනය කිරීමෙන් අනතුරුවයි.
   (4) විද්‍යුත් උපකරණවලට පරිපථ සකස් කිරීමේදී සංඛ්‍යාංක තාක්ෂණය යොදා ගත හැකිය.

20. ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට නිල වශයෙන් සිදු කළ ගුවන් විදුලි ප්‍රචාරය මෙහෙයවන ලද්දේ,
   (1) විදුලි සංදේශ ඉංජිනේරු ඊ හාෆර් මහතා විසිනි.
   (2) ප්‍රසිද්ධ ව්‍යාපාරික උපාලි විජේවර්ධන මහතා විසිනි.
   (3) පුවත්පත් සංස්කාරක ජෝර්ජ් ලී විසිනි.
   (4) චිත්‍රපටි අධ්‍යක්ෂ ඩේවිඩ් වෝක් ග්‍රිෆිත් විසිනි.

21. කාර්යාලයකට ලිපියක් ලැබුණු දිනය සහතික කිරීම සඳහා යොදාගනු ලබන්නේ,
   (1) නිල මුද්‍රාවයි. (2) තැපැල් මුද්‍රාවයි. (3) දින මුද්‍රාවයි. (4) ලියාපදිංචි කළ දිනයයි.

22. සමාජීය පුද්ගලයකු ලෙස සාර්ථකව ජීවත්වන්නට මූලික වශයෙන්ම තිබිය යුත්තේ,
   (1) අවාචික සන්නිවේදන නිපුණතාය. (2) වාචික සන්නිවේදන නිපුණතාය.
   (3) ලිඛිත සන්නිවේදන නිපුණතාය. (4) දෘශ්‍ය සන්නිවේදන නිපුණතාය.

23. සාවද්‍ය වාක්‍ය තෝරන්න.
   (1) සිනමාව සඳහා නිශ්චල ඡායාරූප අවශ්‍ය නොවේ.
   (2) සිහිවටන ලෙස ඡායාරූප භාවිතා කළ හැක.
   (3) විෂය මූලික අවශ්‍යතාවයන් ඉටු කිරීමට ඡායාරූප යොදා ගනියි.
   (4) භාවිතා නොකළ සේයා පටල ආලෝකය නොවැදෙන ලෙස අසුරා තිබිය යුතුය.

24. රජය ජනමාධ්‍ය සහ ජනතාව අතර යහපත් සම්බන්ධතාවයක් පැවතිය යුත්තේ,
   (1) රජයේ පැවැත්ම සඳහාය. (2) ජනතාවගේ පැවැත්ම සඳහාය.
   (3) මාධ්‍යයේ පැවැත්ම සඳහාය. (4) රාජ්‍යයේ පැවැත්ම සඳහාය.

25. A - දිවා කල සිදු වූ දේ රාත්‍රියේ දී ගිනි මැල වටා රඟ දැක්වීම.
   B - ගල් ගුහාවල චිත්‍ර ඇඳීම.
   C - සතුන්ගේ විවිධ හඬ අනුකරණය කරමින් විවිධ නාද පිටකිරීම.
   D - සතුන් මඟින් පණිවිඩ යැවීම.

   ඉහත කරුණු අතරින්, ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා නිර්මාණාත්මක සන්නිවේදන විධි භාවිතා කර ඇති අවස්ථා වන්නේ,
   (1) A, B හා C ය. (2) B, C හා D ය. (3) A, B හා D ය. (4) A, B, C හා D ය.

26. ජනමාධ්‍ය ආයතන ග්‍රාහකයන් ආකර්ශනය කර ගැනීමට නිරන්තර උත්සාහයක යෙදෙන්නේ,
   (1) තම මාධ්‍ය ආයතනයේ වැඩ සටහන් ග්‍රාහකයාවෙත සමීප කිරීමේ අවශ්‍යතාවය නිසා ය.
   (2) ග්‍රාහක නැඹුරුතාව වැඩි මාධ්‍ය සඳහා ව්‍යාපාරිකයා ආකර්ශනය කර ගැනීම පහසු නිසාය.
   (3) නිරන්තර විනෝදාස්වාදය ග්‍රාහක ආතතීන් දුරු කරන නිසාය.
   (4) මාධ්‍ය සහ ග්‍රාහකයා අතර යහපත් සබඳතාවය තුළින් විචාරශීලී ග්‍රාහකයන් බිහිවන නිසා ය.

27. ජන සන්නිවේදනයේ දක්නට ලැබෙන ලක්ෂණයක් වන්නේ,
   (1) ක්ෂණික ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක් සහිත වීම. (2) සන්නිවේදකයා හා ග්‍රාහකයා සම්මුඛ වීම.
   (3) ආයතනික ව්‍යුහයකින් යුක්ත වීම. (4) ද්විමාර්ගික සන්නිවේදන අවස්ථා බහුල වීම.

28. සන්නිවේදන ක්‍රියාවලිය අංග සම්පූර්ණ වීමට හේතු වන්නේ,
   (1) සන්නිවේදකයාගේ බහුශ්‍රැත භාවයයි. (2) ග්‍රාහකයාගේ විචාරශීලී භාවයයි.
   (3) බාධක සිදුවීම පාලනය කර තිබීමයි. (4) ප්‍රතිපෝෂණ ක්‍රියාවලිය සක්‍රීය වීමයි.

29. සෞන්දර්ය යන්නට නිවැරදි නොවන වැකිය තෝරන්න.
   (1) සිත සතුටු කරවන සුලු බව සෞන්දර්යයි.
   (2) ස්වභාවික පරිසරය තුළින් ද සෞන්දර්ය විඳගත හැකිය.
   (3) ජන මාධ්‍යයේ වගකීම විය යුත්තේ ග්‍රාහකයාට සෞන්දර්ය විඳගැනීමට සැලැස්වීමයි.
   (4) සෞන්දර්ය ස්වභාවික පරිසරයෙන් මිස නිර්මාණය කිරීමකින් ලබා ගත නොහැකිය.

30. සන්නිවේදනයේ අරමුණක් විය නොහැක්කේ,
   (1) ග්‍රාහකයාට තොරතුරු ලබාදීම.
   (2) විනෝදයට හා විශ්‍රාන්තියට අවස්ථා සම්පාදනය කර දීම.
   (3) වෙළෙඳ දැන්වීම් මඟින් වැඩි ලාභ ඉපැයීම.
   (4) ග්‍රාහකයන් පෙළඹවීම.

National e-learning Portal for The General Education

31. සමාජ විඥානය යන්නෙන් අදහස් වන්නේ,
(1) උසස් නිර්මාණ බිහි කිරීමයි.
(2) සැබෑ සමාජ සබඳතා අනාවරණය කර ගැනීමයි.
(3) මාධ්‍ය තුළින් උසස් වින්දනාත්මක නිර්මාණ ඉදිරිපත් කිරීමයි.
(4) පුද්ගලික අත්දැකීම් නිර්මාණයක් මගින් පොදු බවට පත් කිරීමයි.

32. කිසියම් රසයක් හඳුනා ගැනීමට හා විඳගැනීමට පුද්ගලයෙකු සතු හැකියාව,
(1) විනෝදාස්වාදයයි. (2) විශ්‍රාන්තියයි. (3) රසඥතාවයයි. (4) නිර්මාණාත්මක චින්තනයයි.

33. පුවත්පත් සඳහා අදාල නොවන වැකිය තෝරන්න.
(1) පුවත් පතක කාටූන් අයත් වන්නේ විශේෂාංගවලටය.
(2) පුවත්පත අලෙවි කිරීමෙන් පමණි පුවත් පතක් ආදායම් ලබන්නේ.
(3) පුවත්පතක සංස්කරණ අංශයේ ප්‍රධානියා ප්‍රධාන උප කර්තෘ ලෙස හැඳින්වෙයි.
(4) 1871 දී ප්‍රකාශයට පත් වූ කවට කතිකයා කර්තෘ හිමි පුවත්පතකි.

34. ඩිජිටල් ඡායාරූපකරණයේ ලක්ෂණයක් වන්නේ,
(1) රසායනික ඡායාරූපකරණය භාවිතා කරීම.
(2) 'පැසරුම්කරණය' සඳහා වැඩි කාලයක් ගතවීම.
(3) අඩු ආලෝකයකදී ඡායාරූපයක් ගැනීමට කැමරාවට නොහැකි වීම.
(4) ලබාගත් ඡායාරූප ඒ අවස්ථාවේදීම නැරඹිය හැකි වීම.

35. කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රය සඳහා භාවිත කරනු ලබන්නේ,
(1) කලු / සුදු හෝ වර්ණ ඡායාරූප ය.
(2) විනිවිදක පත්‍ර වලින් සකසන ලද රූප සටහන් ය.
(3) පරිගණකයෙන් සැලසුම් කරන ලද තොරතුරු ය.
(4) ධන ඵලකවලින් සකසන ලද විනිවිදක රූප රාමු ය.

36. A - කථනය වෙනුවට කෙටි ලිඛිත සන්දේශ හෝ සංඥා යැවිය හැකි වීම.
B - ආරම්භක ස්ථානයේ සිට වැඩි ගමනාන්ත සංඛ්‍යාවකට එකවර සන්දේශයක් යැවිය හැකි වීම.
C - රහස් රහිතව තොරතුරු හුවමාරු කළ හැකි වීම.
D - යවන ලද සංඥාව නිශ්චිත බැවින් වහා ප්‍රතික්‍රියා කළ හැකි වීම.
ඉහත ලක්ෂණ දැකිය හැකි වන්නේ,
(1) ෆැක්ස් යන්ත්‍රයේ ය. (2) දුරකථනයේ ය. (3) අන්තර්ජාලයේ ය. (4) පේජරයේ ය.

37. සන්නිවේදන ක්‍රියාවලිය අසාර්ථක කිරීමට හේතුවන බාධක අවම කිරීමට කටයුතු කිරීමේ මූලික වගකීම පැවරෙන්නේ,
(1) සන්නිවේදකයාට ය. (2) නාලියට ය. (3) ග්‍රාහකයාට ය. (4) දොරටුපාලකවරයාට ය.

38. අවිධිමත් සන්නිවේදනය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - විධිමත් සන්නිවේදනය හොඳින් ශක්තිමත් කළ විට අවිධිමත් සන්නිවේදනය වැළැක්විය හැකිය.
B - විධිමත් සන්නිවේදනයට වඩා බෙහෙවින් වේගවත් ය.
C - සන්දේශය වඩාත් සංවර්ධනය වී හිතකර ආකාරයෙන් ග්‍රාහක ගත වේ.
D - අවිධිමත් සන්නිවේදනයට කටකතා, කේලාම්, ඕපාදූප ආදිය අයත් වේ.
ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ,
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා D පමණි. (4) C හා D පමණි.

39. ගංවතුරට හසුවීම නිසා පොත් අල්මාරිය තුළ තිබූ නිමල් ගේ අධ්‍යාපන සහතික හා උප්පැන්න සහතිකය ද අකුරු බොඳවී විනාශ වී තිබුණි. මෙය වලක්වා ගැනීමට නිමල්ට මුලින්ම කළ හැකිව තිබුණේ,
(1) සේප්පුවක දමා තැන්පත් කිරීමයි.
(2) පොලිතීන් කවරයක දමා හොඳින් ආවරණය කර තැබීමයි.
(3) ඥාති නිවසක තැන්පත් කර තැබීමයි.
(4) ලැමිනේට් කර තැබීමයි.

40. විද්‍යුත් තැපැල පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - යවන්නාට හා ලබන්නාට ලෝකයේ කොතැනක සිටිය ද ක්ෂණිකව තොරතුරු හුවමාරු කරගත හැකිය.
B - මුරපදයක් අත්‍යවශ්‍ය වන අතර එය දෙවරක් වෙනස් කළ නොහැකි ය.
C - ඡායාරූප, වීඩියෝ, චිත්‍රපට, සුබපැතුම් පත් ආදියද හුවමාරු කර ගත හැකිය.
D - කාර්යාලයකට නිල විද්‍යුත් ලිපිනයක් ලබා ගැනීමේ දී මුදල් ගෙවීම අවශ්‍ය නැත.
ඉහත ප්‍රකාශ අතරින්, සත්‍ය වන්නේ,
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) A, B, C හා D යන සියල්ලම.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2016

**10 ශ්‍රේණිය** **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

<u>වැදගත් :</u>

- පළමුවන ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

---

01 වයඹ පළාත් නව නිපැයුම් කරුවන්ගේ තරගයක් සහ ප්‍රදර්ශනයක් පසුගිය දා කුරුණෑගල නගර සභා ශාලාවේ දී පැවැත්වුණි. ත්‍යාග, සහතිකපත්, බෙදාදීම සහ ප්‍රධාන දේශනය පැවැත්වීම ජනාධිපතිතුමා විසින් සිදු කරන ලදී.

(1) නව නිපැයුම් ඉදිරිපත් කිරීමට පළාත් වාසීන්ට ආරාධනා කිරීමට සංවිධායක මණ්ඩලයට යොදා ගත හැකි වූ ප්‍රධාන සන්නිවේදන ක්‍රම 02 ක් සඳහන් කරන්න.

(2) රැස්ව සිටි පිරිස අමතා නව නිපැයුම් අගයමින්, ජනාධිපතිතුමා සිදුකළ හරවත් දේශනය ජනමාධ්‍ය කිහිපයකින්ම ප්‍රචාරය කරන ලදී. මෙහි දැකිය හැකි සන්නිවේදන වර්ග සහ ස්වරූප දෙක බැගින් සඳහන් කරන්න.

(3) මෙම ප්‍රදර්ශනය සහ උත්සවය මගින් ඉටුකර ගත හැකි සන්නිවේදන අරමුණු 04 ක් ලියන්න.

(4) මෙම උත්සවය සහ ජයග්‍රාහී නව නිපැයුම් කරුවන් පිළිබඳ ප්‍රවෘත්ති ජනමාධ්‍යයෙන් ප්‍රචාරය විය. මෙම ප්‍රවෘත්තිවල අන්තර්ගත විය යුතු පොදු ප්‍රශ්න 04 ක් දක්වන්න.

(5) මෙහි ඉදිරිපත් කර තිබූ සියලු නිමවුම්වල ඡායාරූප සහ විස්තර පරිගණක ගත කරන ලදී. ඒ හැර මෙම තොරතුරු ගබඩා කර තැබිය හැකි වෙනත් ක්‍රම 02 ක් ඉදිරිපත් කරන්න.

(6) ප්‍රදර්ශනය පැවැත්වෙද්දී නිපයුම්කරුවන් තම නිර්මාණය පිළිබඳ විස්තර ප්‍රේක්ෂකයන්ට සපයන ලදී. ඔවුන්ට නිපයුම් කරුවන් පුද්ගලිකව හමුවීමට භාවිතා කිරීමට, නිපැයුම්කරුවන්ගෙන් ලබාගත හැකි තොරතුරු 2 ක් නම් කරන්න.

(7) විවිධ ක්ෂේත්‍රවලට අයත් නව නිපයුම් රැසක් නිර්මාණය කර තිබුණි. ඒවා ව්‍යාපාරයන් ලෙස පවත්වාගෙන යාමට ජනමාධ්‍යට අතදිය හැකි අවස්ථා දෙකක් පෙන්වන්න.

(8) මෙම උත්සවය සම්බන්ධයෙන් තොරතුරු විකෘති කර සමහර ජන මාධ්‍යවල පලවී තිබුණි. විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය සඳහා රජය විසින් ස්ථාපිත නියාමන ආයතන 02 ක් සඳහන් කරන්න.

(9) උත්සවයෙන් පසු නව නිපයුම්කරුවන්ගේ නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීමට සාකච්ඡා කිරීමට පැමිණෙන ලෙස දන්වා ජනාධිපති තුමා වයඹ පළාත් මහ ඇමතිවරයාට විද්‍යුත් තැපැල් පණිවිඩයක් (E-mail) යවන ලදී. විද්‍යුත් තැපැල තුළ දැකිය හැකි විශේෂතා 02 ක් සඳහන් කරන්න.

(10) ''අලුත් අලුත් දෑ තනමින් ජාතිය ගොඩනැගීම පුරවැසියෙකුගේ යුතුකම'' බව ජනාධිපතිතුමාගේ කථාවෙහි සඳහන් විය. පුරවැසියා සහ රාජ්‍ය අතර ඇති සම්බන්ධය දක්වන්න.

02 (1) සන්නිවේදකයාගේ අරමුණු මෙන්ම ග්‍රාහකයාගේ ප්‍රතිචාරයන් ද ක්ෂණිකව හඳුනාගත හැකි වන පරිදි යෙදිය හැකි සන්නිවේදන වර්ගය කුමක් ද?

(2) සමාජයක ඉදිරි පැවැත්ම සඳහා පවුලකින් ඉටුවිය යුතු යුතුකම් දෙකක් දක්වා ඒ සඳහා ගොඩනැගිය යුතු ගුණාංග නම් කරන්න.

(3) විචාරශීලීබවින් තොරව රූපවාහිනිය නැරඹීමට යොමුවීමෙන් ඇතිවිය හැකි අහිතකර බලපෑම් 03 ක් විස්තර කරන්න.

(4) අවිධිමත් සන්නිවේදනයේ දී ග්‍රාහකයා බුද්ධිමත් විය යුත්තේ, එයින් සමාජයට බලපෑම් එල්ල කළ හැකි බැවිනි. අවිධිමත් සන්නිවේදනය සමාජය තුළ ක්‍රියාත්මකවන ආකාර 04 ක් පැහැදිලි කරන්න.

03 (1) 1991 න් පසු ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි සේවයේ රාජ්‍ය ඒකාධිකාරය අහෝසි කිරීමෙන් පසු සිදු වූ වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

(2) නිශ්චල ඡායාරූපයක වැදගත්කම පෙන්වීමට කරුණු 04 ක් දක්වා එකක් පැහැදිලි කරන්න.

(3) කිසියම් ලේඛනයක් ඵලදායී ලේඛනයක් බවට පත්වීමට අවශ්‍ය සාධක 03 ක් නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න.

(4) පුවත් පතක සංස්කරණ අංශයෙන් සිදුකෙරෙන කාර්යයන් 03 ක් දක්වා, පැහැදිලි කර, සංස්කරණ අංශය සහ දැන්වීම් අංශය අතර ඇති සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

04 (1) සාම්ප්‍රදායික දෘශ්‍ය මාධ්‍ය දෙකක් හා සාම්ප්‍රදායික ශ්‍රව්‍ය මාධ්‍ය දෙකක් නම් කරන්න.

(2) ද්විපුද්ගල අනභිමුඛ කතිකාවක් සඳහා භාවිත කළ හැකි මාධ්‍ය උපකරණය නම් කර එය භාවිතයේ දී පිළිපැදිය යුතු ආචාර ධර්ම තුනක් කෙටියෙන් දක්වන්න.

(3) ජනමාධ්‍ය ආයතන ආදායම් ලබා ගන්නා ක්‍රම දක්වා, මිල තීරණය කිරීමේ ක්‍රමවේද පැහැදිලි කරන්න.

(4) ඡායාරූපයක් ගැනීමේ පියවර නම් කර එය එක් එක් අවස්ථාවලදී සිදු කෙරෙන කාර්ය පැහැදිලි කරන්න.

05 (1) නිශ්චල ඡායාරූපයක් ගැනීමේදී ඊට සම්බන්ධවන පාර්ශව නම් කරන්න.

(2) ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ව්‍යාපාරික ආයතන ස්ථාපිත වී ඇති ආකාර නම් කර, එම ව්‍යාපාරවල ප්‍රතිපත්ති, තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරෙන්නේ කවුරුන් වෙතදැයි පැහැදිලි කරන්න.

(3) 'දුෂ්කර පාසලක විදුහල්පතිවරයෙකු වන සේනාරත්න මහතා දෙදරු පියෙකි. මීට තෙවසරකට පෙර දේශපාලනමය හේතු මත ඔහුට මෙම පාසලට ස්ථාන මාරුවක් ලැබුණි. මේ කිසිවකින් කම්පා නොවූ ඔහු එකම අරමුණ කර ගත්තේ පාසලේ දරුවන්ගේත් තම දරුවන්ගේත් නැණස පාදා අනාගත යහපත් පුරවැසියන් රටට දායාද කර වීමය. දේශපාලකයින්ව ගණන් නොගත් ඔහු ඕනම ආණ්ඩුවක දුර්වලතා විවේචනය කළේය.'

මෙම ඡේදය ආශ්‍රය කරගෙන පිළිතුරු සපයන්න.

මෙහි දැකිය හැකි පුරවැසියෙකු තුළ තිබිය යුතු ලක්ෂණ 03 ක් පැහැදිලි කරන්න.

(4) ඉහත සඳහන් ඡේදය තුළ උල්ලංඝනය වී ඇති මානව අයිතිවාසිකම් දෙකක් පැහැදිලි කොට, මානව අයිතිවාසිකම් පිළිබඳ නීතිමය තත්ත්වය සටහන් කරන්න.

06 (1) 'ජනමාධ්‍ය පරිහරණය' වර්තමාන මිනිසාගේ මූලික අවශ්‍යතාවයක් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(2) වාචික සන්නිවේදනයේ දී භාවිතයට ගත හැකි අවාචික සන්නිවේදනයේ ශාරීරික සාධක 04 ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(3) සේයා පටලයක ස්වභාවය හඳුන්වා, සේයා පටලයෙන් සිදු කෙරෙන කාර්ය දක්වන්න.

(4) සන්නිවේදන වර්ගයක් ලෙස ජන සන්නිවේදනයෙහි ස්වභාවය කරුණු 04 ක් ඇසුරින් පැහැදිලි කරන්න.

07 (1) ''පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ පළමු පියවර වන්නේ, අකුරු යෝජනයයි.'' ඉහත ප්‍රකාශනයට ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතුව දක්වන්න.

(2) ''පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා ගුරුවරයාට ප්‍රදීපාගාර සංකල්පය ක්‍රියාත්මක කළ හැකිය.'' ඉහත ප්‍රකාශයට ඔබ එකඟවන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දෙකක් දක්වන්න.

(3) ''සංවෘත රූපවාහිනී කැමරා ක්‍රියාත්මකවීමේ ස්වභාවය අනුව සෑම වෙළෙඳසැලකම සවිකිරීම අත්‍යවශ්‍යය.'' මෙම ප්‍රකාශයට ඔබ එකඟවන්නේ ද? ඔබේ පිළිතුර කරුණු 03 ක් ඇසුරින් පැහැදිලි කරන්න.

(4) 'පන්තිකාමර මාධ්‍ය උපකරණයක් ලෙස චුම්බක පුවරුව මගින් ලැබෙන ප්‍රයෝජනය කළුලෑල්ල හෝ සුදුලෑල්ලෙන් ලැබෙන ප්‍රයෝජනයට සර්වසම වේ.'' මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුර කරුණු 04 ක් ඇසුරින් පැහැදිලි කරන්න.

### පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(1) | 2 -(2) | 3 -(4) | 4 -(3) | 5 -(3) | 6 -(1) | 7 -(3) | 8 -(4) | 9 -(2) | 10 -(1) |
| 11-(2) | 12 -(2) | 13 -(2) | 14 -(4) | 15 -(3) | 16 -(2) | 17 -(3) | 18 -(4) | 19 -(2) | 20 -(1) |
| 21-(3) | 22 -(2) | 23 -(1) | 24 -(4) | 25 -(1) | 26 -(2) | 27 -(3) | 28 -(4) | 29 -(4) | 30 -(3) |
| 31-(2) | 32 -(3) | 33 -(2) | 34 -(4) | 35 -(4) | 36 -(4) | 37 -(1) | 38 -(3) | 39 -(4) | 40 -(2) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

### II කොටස

(01) (1) ජනමාධ්‍ය තුළ දැන්වීම් ප්‍රචාරය කිරීම මගින් / පෝස්ටර් මගින් / ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කිරීම මගින් / ක්ෂේත්‍ර නිලධාරීන් මගින් (ල.02)

(2) වර්ග සමූහ, ජන සන්නිවේදනය / ස්වරූප වාචික, ශ්‍රව්‍ය, දෘශ්‍ය (ල.02)

(3) තොරතුරු ලබා ගැනීම / අධ්‍යාපනය ලැබීම / විනෝදාස්වාදය / පෙළඹවීම (ල.02)

(4) කුමක් ද? / කෙසේ ද? / කවුද? / කවදා ද? / කොහේ ද? / කොයිවෙලාවේ ද? යනාදී 04 කට (ල.02)

(5) වීඩියෝ එකක් සකස් කිරීම / සී.ඩී. එකක් හෝ ඇල්බම් එකක් සකස් කිරීම (ල.02)

(6) දුරකථන අංකය / ඊමේල් ලිපිනය / විසිටින් කාඩ් එක (ල.02)

(7) ප්‍රවෘත්ති ප්‍රකාශනයේදී ප්‍රවෘත්තියක් ලෙස උත්සවය පිළිබඳ විස්තර ප්‍රකාශ කිරීම. / ප්‍රවෘත්ති සංදර්ශනයක් ලෙස විද්‍යුත් මාධ්‍ය තුළින් මෙම වැඩ සටහනේ සංස්කරණයක් ඉදිරිපත් කිරීම. පුවත්පත්වල ප්‍රවෘත්ති ලෙස සහ විශේෂාංග ලෙස ඉදිරිපත් කිරීම. / මෙම ප්‍රදර්ශනය සහ උත්සවයට සපැමිණි ප්‍රභූන් සමග, විශේෂයෙන් කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, දේශපාලකයින්, සමග මෙම කර්මාන්ත ඉදිරියට ගෙනයා හැකි ආකාරය පිළිබඳව මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වීම. / බැංකු, රක්ෂණ, අනුග්‍රාහක හවතුන්ට ආරාධනා කොට මාධ්‍ය සාකච්ඡා පවත්වමින් නිපැයුම්කරුවන්ට අඩු පොලියකට මූල්‍ය පහසුකම් ලබා ගැනීමට, වෙළෙඳ පොළක් සකස් කර ගැනීමට අත දීමට පෙළඹවීම. (ල.02)

(8) මුද්‍රිත ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය / විද්‍යුත් විදුලි සංදේශ නියාමන කොමිසම (ල.02)

(9) වේගවත් බව / පණිවිඩය කියවන තෙක් රඳවා තබා ගත හැකිවීම. / හඬ කොටස්, ඡායාරූප, සිතුවම්, සුහපැතුම් යනාදිය යැවිය හැකි වීම. / සාමාන්‍ය තැපැලට සාපේක්ෂව වියදම අඩුවීම.

(10) පුරවැසියා යනු යම් නීත්‍යානුකූල දේශ සීමාවක් තුළ නීත්‍යානුකූලව ජීවත්වන පුද්ගලයාය. / රාජ්‍යයක්, නිර්මාණය වී තිබෙන්නේ එවැනි පුද්ගලයන් රාශියකගේ එකතුවෙනි. (ලකුණු $2 \times 10 = 20$)

(02) (1) අන්තර්පුද්ගල සන්නිවේදනය (ල.01)

(2) පරම්පරාව පවත්වාගෙන යාම. / පවුලේ සාමාජිකයන් පෝෂණය කිරීම. / හොඳ නරක, සිරිත් විරිත් සමාජ සම්මතයන් ආදිය පිළිබඳව පවුලේ නවක සාමාජිකයන් නිරන්තරයෙන් දැනුවත් කිරීම. / සමගිව සහයෝගයෙන්, සහජීවනයෙන් යුතුව පවුල තුළ වාසය කිරීම. (කරුණු 02 කට ල.01) ගුණාංග : පවුල තුළ ආරක්ෂාව, ආදරය, කරුණාව, විශ්වාසය, සමීප බව, කැපවීම, අන්‍යෝන්‍ය අවබෝධය යන ගුණාංග ගොඩ නඟා ගත යුතු වෙයි. (ල.01)

(3) දෛනික ජීවිතය වෙනස් වීම. / පරිභෝජන රටාව වෙනස්වීම. / රසවින්දනය වෙනස් වීම. / විවිධ චිත්තවේග වැඩි දියුණු වීම. / විවිධ අපචාරී චර්යා කරා යොමු වීම. / විවිධ අයෝග්‍ය පුරුදු ඇතිවීම. / සමාජීය ගැටලු වැරදි ආකාරයට තේරුම් ගැනීම. / ජීවිත ගැටලුවලට අයෝග්‍ය තීරණ ගැනීම. / අන්‍යෝන්‍ය සම්බන්ධතා පළුදු වීම. / සාවද්‍ය සමාජාර්ථ ගොඩනැංවීම. (ලකුණු $1 \times 3 = 3$) (විස්තර කර තිබිය යුතුයි.)

(4) තනි දාමය / ඕපාදූප දාමය / සම්භාවිතා දාමය / පර්ෂද දාමය (කරුණු 04 ක් පැහැදිලි කිරීමට ලකුණු $1 \times 4 = 4$)

(03) (1) ගුවන් විදුලි සේවය වෙනුවෙන් ගුවන් විදුලි යන්ත්‍රවලට නිකුත් කළ බලපත්‍ර ක්‍රමය අහෝසි වීම. / පෞද්ගලික අංශයට ගුවන් විදුලි සේවා ආරම්භ කිරීමට අවසර ලැබීම. (ල.01)

(2) ගතවී යන කාලයෙන් එක් මොහොතක් රඳවා ගැනීමට. / අවස්ථාවක් පැහැදිලි කරනවාට වඩා ඇසින්ම දැකගත හැකි වීමෙන් විශ්වාසයක් ඇතිවීම. / වචනයෙන් විස්තර කළ නොහැකි දර්ශන ඡායාරූපයෙන් ඉදිරිපත් කළ හැකි වීම. / ඡායාරූපය නිසා මතකයෙන් ඇත් වූ දෙය නැවත සිහිකර ගත හැකි වීම. / මානසික සන්තුෂ්ටියක් ලැබීම. / එකිනෙකාගේ පුරුදු, ගති සිරිත් හඳුනා ගැනීමට හැකිවීම. / කිසියම් සිදුවීමකදී හඳුනා ගැනීමේ සාක්ෂියක් ලෙස ඉදිරිපත් කිරීමට. / විනෝදය සඳහා (කරුණු 4 ට ලකුණු 01, පැහැදිලි කිරීමට ලකුණු 1 (1+1+2)

(3) නිරවුල් බව හා පැහැදිලි බව / ලේඛනයට උචිත ආකෘතිය හා නිර්මාණශීලී බව / සම්මත ව්‍යාකරණ විධි භාවිතය (නම්කර විස්තර කිරීමට $1 \times 3 =$ ල. 3)

(4) සංස්කරණ අංශයේ උපකතෘවරු විසින් ප්‍රවෘත්ති පිටු සංස්කරණය කිරීම. / ප්‍රවෘත්ති වාර්තාකරුවන් සහ මාණ්ඩලික ලේඛකයන් සපයන තොරතුරු ප්‍රවෘත්තියක් ලෙස උපකතෘන් විසින් සකස් කිරීම. / පිටුවේ ඉඩ අවකාශත්, තොරතුරේ වැදගත්කමත් අනුව පලකල යුතු ඉඩ ප්‍රමාණය තීරණය කිරීම. / එම ප්‍රවෘත්තියට මාර්තෘකාවක් යෙදීම. ( කරුණු 3 පැහැදිලි කිරීමට ල. 3) දැන්වීම් අංශය සහ සංස්කරණ අංශය අතර සෘජු සම්බන්ධතාවයක් පවතී. දැන්වීම් අංශය මගින් දැන්වීම්වල ස්වභාවය අනුව දැන්වීම් සඳහා ඒ ඒ පිටුවල ඉඩකඩ වෙන්කර ගැනීම මූලිකව සිදු කරයි. එම පිටුවල හිස් කොටසේ විශේෂාංග සැලසුම් කිරීම, ඉන්පසුව සංස්කාරක කර්තෘ විසින් සිදු කරයි. මෙම ක්‍රියාවලිය සඳහා මෙම අංශ දෙක අතර සෘජු සම්බන්ධතාවය. (ල.01) $(3 + 1 = 4)$

(04) (1) <u>සාම්ප්‍රදායික දෘශ්‍ය මාධ්‍ය :</u> ගින්දර, දුම, ගස්වල එල්ලූ කොළ අතු, චිත්‍ර, ගස්වල කැපූ කට්ටා

<u>සාම්ප්‍රදායික ශ්‍රව්‍ය මාධ්‍ය :</u> හූව, සණ්ඨාර හඬ, බෙර හඬ, සත්ව නාද, ස්වාභාවික ශබ්ද (දෙක බැගින් 04 ක් නම් කිරීමට ල.01 යි.)

(2) දුරකථනය (ල.½) දුරකථන ඇමතුම් ලබාගන්නා පුද්ගලයා ඇමතුම සක්‍රීය වූ විගස තමන්ගේ අනන්‍යතාව හෙළි කළ යුතුය. / දෙපාර්ශවයේ ම ගෞරවය රැගෙන පරිදි වචන භාවිතා කළ යුතුය. / කිව යුතු දේ කෙටියෙන් කිව යුතුය. / දුරකථනයෙන් විසඳා ගත නොහැකි ප්‍රශ්න සඳහා එය යොදා නොගත යුතුය. ආදී ලෙස..., (ල. $\frac{1}{2} \times 3 = 1\frac{1}{2}$ (මුළු ලකුණු 2)

(3) පුවත්පත, ගුවන්විදුලිය සහ රූපවාහිනිය ආදායම් ලබා ගන්නේ වෙළෙඳ දැන්වීම් සහ අනුග්‍රාහකත්වය දැරීම තුළින් ය. එක් එක් මාධ්‍ය වෙළෙඳ දැන්වීම් සහ අනුග්‍රාකත්වය සඳහා මිල අඩු වැඩි ලෙස අයකර ගන්නා ආකාරය පැහැදිලි කිරීමට. (ල. $1 \times 3 = 3$)

(4) මානනය / නාභිගත කිරීම / අනාවරණය (ල.01)

<u>මානනය :</u> අරමුණට අනුව කැමරාවට හසුකර ගන්නේ කුමක් ද යන්න තීරණය කිරීම / රූප රාමුවට ඇතුලත් කර ගත යුත්තේ මොනවා ද? / ඒවා ඡායාරූප කළ හැකි ආකාරයට කැමරාව පිහිටුවා ගැනීම. / කැමරා කාචය තුළ මනා ලෙස වස්තූන් පිහිටුවා ගැනීම මානනයයි.

<u>නාභිගත කිරීම :</u> ඡායාරූපයට හසුකර ගන්නා අරමුණ (මානනය කළ දෙය) වඩාත් පැහැදිලි වන සේ කාචය සීරු මාරු කිරීම.

<u>අනාවරණය :</u> කාච විවරයේ සහ ද්වාරයේ පිහිටීම නිසි පරිදි සකස් කොට ආලෝකය පාලනය කිරීම සහ ප්‍රතිබිම්බය සටහන් කර ගැනීම. (1×3=4) (ල. $3 + 1 = 4$)

(05) (1) ඡායා රූප ශිල්පියා / කැමරාව / අරමුණ (අපේක්ෂිත දර්ශනය) / ආලෝකය (ල.01)

(2) රාජ්‍ය සංස්ථාවක් හෝ රජයට අයත් සමාගමක් ලෙස / සීමාසහිත පෞද්ගලික සමාගමක් ලෙස (ල.01)

<u>වගකීම පැවරෙන්නේ :</u> ජනමාධ්‍ය ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියාටය. (සාමාන්‍යාධිකාරී, කළමනාකරණ අධ්‍යක්ෂ, අධ්‍යක්ෂ ජනරාල් යනාදී ලෙස දක්වීම ද නිවැරදිය.) කෙටියෙන් පැහැදිලි කිරීම (ල.01) $(1 + 1 = 2)$

(3) ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියෙකු ලෙස ජීවත්වීම / ඡන්ද අයිතිය පාවිච්චි කිරීම / නීති ගරුක වීම. / සමාජ සුභ සාධනයට කටයුතු කිරීම. / දේශාභිමානීව කටයුතු කිරීම. / යහපත් ලෙස වෘත්තියක නියලීම (තුනක් පැහැදිලි කිරීමට ල.03)

(4) තමා කැමති ප්‍රදේශයක ජීවත්වීමේ අයිතිය. / ප්‍රජාතන්ත්‍රවාදීව ඡන්දය පාවිච්චි කිරීමේ නිදහස. / භාෂණයේ නිදහස / තමා කැමති දේශපාලන මතවාදයක් දැරීමේ අයිතිය. (දෙකක් පැහැදිලි කිරීමට ල.02)

<u>නීතිමය තත්ත්වය :</u> 1947 දී එක්සත් ජාතීන්ගේ සංගමය විසින් සෑම පුද්ගලයෙකුටම නිදහසේ ජීවත්වීමට ඇති අයිතිය පිළිගැනෙන, විශ්ව මානව හිමිකම් ප්‍රකාශනය සම්මත කර ගන්නා ලදී. බොහෝ රටවල්වල ව්‍යවස්ථාගත කිරීමෙන්ම මානව හිමිකම් නීති ගත කර තිබේ. ළමා සහ කාන්තා අයිතිවාසිකම් ද සම්මුතීන් බවට පත්වී තිබේ. සමාජයක මානව හිමිකම් සුරැකීමේ අයිතිය රජයට ද, රාජ්‍යයේ ජීවත්වන පුරවැසියන්ට ද පැවරී තිබේ. (ල.02) $(2 + 2 = 4)$

(06) (1) දෛනික පැවැත්මේදී අත්‍යවශ්‍ය වන තොරතුරු සපයා ගැනීම, අධ්‍යාපනය ලබාගැනීම, විනෝදාස්වාදය, පෙළඹීම, සංස්කෘතිය පවරා ගැනීම, සමාජානුයෝජනය යනාදී සන්නිවේදන අරමුණු ඉටුකර ගැනීමට මුල්වන කාරකයක් ලෙස ජනමාධ්‍ය කටයුතු කරන බැවිනි. (ල.01)

(2) ශාරීරික ඉඟි හා ඉරියව් / මුහුණේ ඉඟි හා ඉරියව් / ඇස්වල හැසිරීම / හඬ, උච්චාරණය හා නිහඬ බව / ස්පර්ශය (ල.02)

(3) සේයා පටලය සෙලියුලොයිඩ් අමු ද්‍රව්‍යයෙන් නිපදවා තිබේ. මෙම පටලය මත ආලෝක සංවේදී රසායනික අඳුනක් (ස්ථරයක්) ගල්වා තිබේ. මෙම රසායනික ස්ථරය රිදී ලෝහය සමඟ ලවන මිශ්‍ර වීමෙන් සෑදුනකි. (ල.02)

<u>කාර්ය වන්නේ :</u> අඳුන ආලෝකයට නිරාවරණය වීමෙන් එහි ඇති අංශු දැවී, කළු පැහැවී ප්‍රතිබිම්බය උත්පාදනය වෙයි. එනම් සේයා පටලයේ කාර්ය වන, සේයා පටලය මත ආලෝකය පතිත වූ විට ඊට අනුරූපීව ඡායාවක් සටහන් කර ගැනීම සිදු වෙයි. (ල.01)

(4) සන්දේශය පොදු වූවකි. / සන්නිවේදකයා හා ග්‍රාහකයා අභිමුඛ නොවේ. / සංවිධිත ආයතන මඟින් ක්‍රියාත්මක වේ. / ග්‍රාහක පද්ධතිය ඉතා විශාල හා පැතිරුණු ස්වභාවයක් ගනී. / වෘත්තීය සන්නිවේදකයන් කටයුතු කරයි. (ල.04)

(07) (1) එකඟ නොවේ. පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ පළමු පියවර වන්නේ අත් පිටපත් සැකසීමයි. (ල.01)

(2) එකඟ වේ. ශිෂ්‍ය අවධානය ලබාගත හැකිවීම. / ශිෂ්‍යයන් සක්‍රීයව පාඩමට සම්බන්ධ කරගත හැකි වීම. / ඵලදායී ඉගෙනුම් අවස්ථාවන් උදාකර ගත හැකි වීම. (කරුණු 2 සඳහා ල.02)

(3) එකඟ වේ. ඒ ඒ ස්ථානවල ඇති CCTV කැමරා මඟින් ලබා ගන්නා දර්ශන එක් පාලක මැදිරියකින් නිරීක්ෂණය කළ හැකි වීම. / තොරතුරු පාලක යන්ත්‍රයේ මතකයේ රඳවා ගැනීම නිසා සොරකම්, මංකොල්ලකෑම් යනාදී අපරාධ අනාවරණය කරගත හැකි වීම. / පද්ධතියට ලබා දී ඇති උපදෙස් අනුව මතකය දිනක් හෝ වැඩි කාලයක් හෝ තබාගත හැකි වීම. (ල.03)

(4) එකඟ නොවේ. කාන්දම් පතුරු මඟින් ඡායාරූප ලැල්ලේ රඳවා තැබිය හැකිය. / සිසුන්ගේ නිර්මාණ ලැල්ලේ රඳවා තැබිය හැකිය. / විවිධ හැඩතල ලැල්ලමත ගොඩනැංවිය හැකිය. / විවිධ රූප ලැල්ල මත ගොඩනැංවිය හැකිය. (ල.04)

The National e-learning Portal for The General Education